# අං කෙළිය ක්‍රීඩාවෙන් මතුවන සන්නිවේදනාර්ථ

පී. ඩී. විමුක්ති චාරිකා වික්‍රමරත්න
ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය , කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

සරල දිවිපෙවෙතකට හුරුපුරුදුව සිටි ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාව ඔවුන්ගේ විවේකය විනෝදයෙන් ගත කිරීම සඳහා බොහෝ විට ජනක්‍රීඩාවල නිරත වූහ. එම ජනක්‍රීඩා ආශ්‍රයෙන් නිර්මාණශීලී හැකියාවන් ඔප්නංවා ගනු ලැබූහ. අන්‍යෝන්‍ය අවබෝධය, කණ්ඩායම් හැඟීම් වර්ධනය කිරීම, නායකත්ව ගුණාංග ඇති කිරීම වැනි ගුණාංග ජනක්‍රීඩා තුළින් ගැමි ජනතාව තුළ රෝපණය විය. අඛන්ඩව ජනක්‍රීඩාවල යෙදීම තුළින් පරම්පරාවෙන් පැවත ආ සංස්කෘතිකාංග ආරක්ෂා වීම මෙහිදී දක්නට ලැබෙන තවත් විශේෂ කරුණකි.

මෙසේ වූ ජනක්‍රීඩා අතර ප්‍රධාන තැනක් ගන්නා අංකෙළිය ක්‍රීඩාවේ සන්නිවේදනාර්ථ විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය. ද්විතීය දත්ත හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රම ඔස්සේ තොරතුරු එක්රැස් කරන ලදී.

අස්වනු නෙලීමෙන් අනතුරුව පත්තිනි දේවිය පිදීම සඳහා යොදාගත් ක්‍රීඩාවක් ලෙසට අං කෙළිය ක්‍රීඩාව හඳුන්වා දිය හැකියි. අං කෙළිය ක්‍රීඩාවේ යෙදීම තුළින් පාරිශුද්ධත්වය හා සෞභාග්‍ය තමා වෙත ලඟා වනවා යන විශ්වාසය ගැමියාගේ සිත තුළ මුල්බැසගෙන තිබෙන කරුණකි. තවද අං කෙළිය ක්‍රීඩාව ලිංගිකත්වය සංකේතවත් කරනු ලැබේ. උඩුපිල හා යටිපිල වශයෙන් දෙපිලකට බෙදෙන ගම්වාසීන් උඩුපිල අලුත් නුවර දෙවියනුත් (පත්තිනි දේවියගේ සැමියා), යටිපිල පත්තිනි දේවියත් නියෝජනය කරනු ලැබේ. අං කෙළිය ක්‍රීඩාවෙන් උඩුපිල ජයග්‍රහණය කලහොත් ගම්වාසීන්ගේ බව භෝග සරුසාර වනවා යන විශ්වාසයත් යටිපිල ජයග්‍රහණය කලහොත් ගම්වාසීන් ලෙඩ රෝග වලින් ආරක්ෂා වී ප්‍රීතිමත්ව ජීවත් විය හැකියි යන විශ්වාසයත් ගැමියා තුළ ඇති වී තිබේ. එසේම ගැමි ජීවන රටාව හා සමීපව බැඳී පවතින ක්‍රීඩාවක් ලෙසටත්, ගැමියා තුළ සමගිය වර්ධනය කරන ක්‍රීඩාවක් ලෙසටත්, සංඥා, සංකේත, සංඥාර්ථවේදය ආදී සන්නිවේදනාර්ථ විශාල වශයෙන් ගැබ් වී ඇති ක්‍රීඩාවක් ලෙසටත් අං කෙළිය ක්‍රීඩාව හඳුනාගත හැකියි.

මුඛ්‍ය පද - සන්නිවේදනාර්ථ, ජනක්‍රීඩා, පාරිශුද්ධත්වය